ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 52/ News/ 2013

ක්‍රි. ව. 2013 අප්‍රේල් 22 සඳුදා
05 වෙළුම - 24 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00

# ළමා ප්‍රදීපය



සේයා : නිළූෂා අලහකෝන්

## ලෝක දේව කැඳවීම් යැදුම් දිනය අප්‍රියෙල් මස 21 ඉරුදින

## පුංචි අපිත් දේව රාජ්‍යය පතල කිරීමට එඩේර දිවියට ඇතුල් වෙමු

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# දේව කැඳවීම් දිනය

## ආදරණීය දුවේ පුතේ...

ඊයේ අපි ලෝක දේව කැඳවීම් දිනය සැමරුවා. මුළු මහත් විශ්ව සභාව එකම පවුලක් සේ එකට බැඳෙමින් අතීතය ආවර්ජනය කරමින් , වර්තමානය විශ්වාස කරමින්, අනාගතය බලාපොරොත්තුවෙන් දල්වාලන්නට මේ දේව කැඳවීම් දිනය යාච්ඤා බරිතව පසු කරන කාල හෝරාවක් බවට නිරතුරුවම පත්කර තිබෙනවා. මේ උතුම් දිනය නිමිති කොට 2012 ඔක්තෝම්බර් 6 වැනි දින විශ්‍රාමික සසුන් පියාණන් විසින් නිකුත් කළ පණිවිඩය ගෙවුනු සතියේ ඥානාර්ථ ප්‍රදීපය පත්තරයේ සම්පූර්ණයෙන්ම පළ කරනු ලැබුවා. ''දේව කැඳවීම විශ්වාසය මත පදනම් වූ බලාපොරොත්තුවේ සංකේතයකි'' යන්න එහි මූලික තේමාව වුනා. ඊයේ දවසේදී අපට ගැඹුරු මෙනෙහි කිරීමක් කරන්නට එය හොඳ අත්වැලක් වුනා.

ආදර දුවේ පුතේ, එය ගැන කල්පනා කිරීමේදී මේ සිතිවිලිත් පහළවෙනවා නේද?. දේව සේවයත් සසුන් මෙහෙවරත් උදෙසා කැපවූ දිවිය පිළිබඳව යැදීම සඳහා පාස්කුවත් සුදත් වැඩුමත් අතර පැවැත්වෙන මෙම දිනය නිමිත්තෙන් වැඩිහිටියන් වෙතත් පැවිදි හා පූජක පිරිස් වෙතිත් කැරෙන ඇරයුම එක් දිනක දෙව් යැදුමකට පමණක් සීමා වන්නක් නොවන බවයි. පැතුමේ මෙන්ම පැවැත්මේ දැහැන ගැනද මේ පණිවුඩය කිතුනු ලොවේ සැලකිල්ල වෙත යොමු කරන්නේ දේව කැඳවීම් මං ගැන්වීම සම්බන්ධයෙන් පවුල නැමැති තෝතැන්න තුළ පැවතිය යුතු වූ පුබුදු ආකල්පයේ වැදගත්කම මතු කරන්නට බවයි.

මෙහිදි ''දේව ජනතාවගේ ජීවිතයට හා ශුද්ධත්වයට අත්‍යවශ්‍යව තිබෙන පූජකවරයට හා කැපවුනු දිවියට කැඳවනු ලැබීම් නිරතුරුවම ආධ්‍යාත්මිකත්වයටත් , දූතික ක්‍රියාවන්ටත්, සැදැහැවතුන්ගේ යාච්ඤාවලටත් කේන්ද්‍රීව කරගන්නට අවැසි සියළු දෑ කිරීම අවශ්‍යව ඇත'' යන්න සසුන් පියා මතක් කරවන කරුණ කිසිවිටෙක හැල්ලු කොට සිතන්නට බැහැ. ශුද්ධත්වයට ප්‍රමුඛත්වය දෙන්නැයි කරන ආයාචනා වල නිමක් නොමැත්තේ මන්ද යන්නත් ඒ හා සමගම විමසීමක් කරන ලෙසටද සසුන් පියා මතක් කරවීමක් කරනවා. නව ධර්මදනයේ මූලික සුදුසුකම මේ හා සමගයි, දැඩිව රැඳී පවතින්නේ.

සභාවේ සෑම කැඳවීමක්ම ශුද්ධත්වයට මඟ සලසතත් පූජකවරයට හා කැපවුණු දිවියට කැඳවීම් වැනි ඇතැම් ඒවා ශුද්ධත්වයට මඟ සලසා දෙන්නේ මුළුමනින්ම විශේෂිත ඇරයුමකිනි. ඒ කැඳවීම් සඳහා වැඩි වැඩියෙන් යාච්ඤා කරමින් ඒවාට විශේෂ අවධානය යොමු කෙරුමට ඊයේ වගේ දිනක් සුවිශේෂී වන්නේ එම නිසාමයි.

නමුත් සංකීර්ණ වෙමින් පවතින සමාජ රටාවලිය තුළ අද කථා කරන වටිනාකම් අනුව යන තැනැත්තේ හුදු උපහාසාත්මක හාස්‍යයකට යොමු කොට ඇති බවක් නේද පෙනී යන්නේ. විශ්වාසයට සාක්ෂ්‍ය දැරීම කෙසේ වෙතත් තමන්ගේ ලබ්ධියේ අනන්‍යතාව පිළිබඳ ඉඟියක් හෝ දක්වාලන්නට ඉදිරියට එන තැනැත්තන් , තැනැත්තියන්ගේ හිඟ කමක්ද වැඩි වෙමින් පවතිනවා. පාසල් පරිසරයන් තුළ එකී වටිනාකම් පිළිබඳ විශාල හිඩැසක් තිබෙනවා. ආගමික දෘෂ්ටිය තුළ ගමනක් ගිය තැනැත්තා , තැනැත්ති තම පහසුව තුළ එකී දහම් පණිවිඩය තමන්ට පමණක් රිසි හිතකර රාමුවක තද කොට හිර කර ගන්නේ තමන් අනුගාමී වන පසු පරම්පරාව ඒ දෘෂ්ටිය තුළ පමණක්ම වෙලී දහම් පණිවිඩය ලබාගත යුතු බවට තර්ජනයක්ද කරමිනි. කැඳවීම් තෝරා බේරා ගන්නට නිනව්වක් නොමැති වුවන් හා ඒ පිළිබඳ වෛරී සිතක් රොපනය කර ගන්නවුන් ඉගැන්වීමේ කාර්යයක යෙදෙන්නෙ නම් තත්ත්වය තවත් දරුණු වනවා පමණක් නොව උගැනුම ලබන්නන්ද ඒහා සමඟම අන්ද මන්ද වීමත් වළකාලන්නට අසීරු වෙනවා.

එම නිසා ආදර දුවේ පුතේ, ''දේව කැඳවීම විශ්වාසය මත පදනම් වූ බලාපොරොත්තුවේ සංකේතයකි'' යන්න උධෘත පාඨය වශයෙන් ගෙන සසුන් පියා විවරණය කරන ගැඹුරු අර්ථය සොයා යන්නට මූලික වශයෙන්ම අද කැඳවීමක් ලත් තැනැත්තන් උත්සුක විය යුතු බව පොදු මතයයි. මන්ද විශ්වාසයේ එකමුතු දිශානතිය එක් දිසාවක් එල්ල කොට ගෙන පමණක් යා යුතු බව සමස්ත සභාවම පුන පුනා මතක් කරන බව අපට අමතක කරන්න බැරි නිසායි.

ආදර දුවේ පුතේ, එම නිසා හුදෙක් කැඳවීම් පතා කරන යාච්ඤාවේ දිනයක් පමණක් නොව ඊට ඔබ්බෙන් ඇති පවුරු වළලු දෙසත් බලා නිර්නය කරවීමක් තුළ විශ්වාසය වර්ධනයේ කිතුනු සංඝයක් බිහි කර ගැනීමත් යුගයේ අවශ්‍යතාව වී ඇති බව අපි අවශයෙන්ම අවධාරණය කර ගත යුතුයි . එයත් මූලික දේව කැඳවීමක් සේ සලකා මේ දිනය සමරන්නට අත් වැල් බැඳ ගනිත් නම් පටු විවේචන, වපර ඇස් වලින් එහා ගොස් දේව රාජ්‍යයේ වටිනාකම් මතුකර ගැනීමේ සාංඝික කැඳවීමක් කරාද සැමට ගමන් කිරීමට යෝධ බලයක් ඒ විශ්වාසයෙන්ම අපට උරුම වනවා. පුංචි ඔබත් මේ ගැන සිතන්නට යොමු වන්න.

**ඔබට ජේසු පිහිටයි.**

සංස්කාරක

ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# මෙරට ඇති විශේෂිත මුද්දර

සාමාන්‍යයෙන් අප රටේ භාවිතකරන තැපැල් මුද්දර ප්‍රධාන වශයෙන් නිත්‍ය කාණ්ඩයේ මුද්දර අති මුද්‍රණය කළ මුද්දර සමරු මුද්දර හා විශේෂ කාණ්ඩයේ මුද්දර ලෙස කාණ්ඩ හතරකට පමණි සීමා වුයේ. එනමුත් එම සියළු කාණ්ඩවලට පරිබාහිරව තවත් කාණ්ඩ දෙකක් දැනට අවුරුදු කීපයකට පෙර ශ්‍රී ලංකා මුද්දර ක්ෂේත්‍රයට හඳුන්වා දී තිබෙන බව ඔබ දන්නවාද?

ඒවා නම් 1. සේවා නිකුත් කිරීම් කාණ්ඩය 2. පුද්ගලී කාරක නිකුත් කිරීමේ කාණ්ඩය. සේවා නිකුත් කිරීම් කාණ්ඩයේ මුද්දර 05 ක් 2008 ජුලි 08 වනදා දිනයේ නිකුත් කරන ලදී. මෙහි අති විශේෂත්වයක් ඇත. මෙම මුද්දර සිවිල් සමාජයේ සාමාන්‍ය ජනතාවගේ තැපැල් කටයුතු සඳහා භාවිතයට ගත නොහැක. පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වෙනුවෙන් නිකුත් කරනු ලබන එම නව මුද්දර කාණ්ඩය ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ගේ විවිධ තැපැල් කටයුතු සඳහා පමණක් භාවිතයට ගැනේ. මෙය එවකට ගරු කථානායක වි.ජ.මු. ලොකු බණ්ඩාර මැතිඳුන්ගේ ඉල්ලීමකට අනුව එම කාලයේදී සිටි තැපැල් විදුලි සංදේශ හා ව්‍යාපෘති ගරු අමාත්‍ය මහින්ද විජේසේකර මැතිතුමාගේ මග පෙන්වීම යටතේ සිදුකරන ලද්දකි.




## මුද්දර ලෝකය



## හඳුනා ගනිමු

**මෙහි අති විශේෂත් වයක් ඇත. මෙම මුද්දර සිවිල් සමාජයේ සාමාන්‍ය ජනතාවගේ තැපැල් කටයුතු සඳහා භාවිතයට ගත නොහැක. පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් වෙනුවෙන් නිකුත් කරනු ලබයි.**

එම මුද්දර පහේම දියවන්නා ඔය පසුබිම් කරගත් නව පාර්ලිමේන්තු සංකීර්ණ ගොඩනැගිල්ලේ අනුරුව දැක්වේ. ඒ අතර රු. 5.00 වටිනාකමින් යුත් මුද්දරය තැඹිලි වර්ණයෙන්ද , රු 10.00යේ මුද්දරය කොළ පැහැයෙන්ද , රු .15.00 වේ මුද්දරය දම් පැහැ යෙන්ද රු.25.00 මුද්දරය නිල් පැහැයෙන්ද රු. 30.00 මුද්දරය රතු පැහැයෙන්ද රාමුගතකර ඇත.

ඒ සෑම මුද්දරයකම රාජ්‍ය ලාංඡනය සටහන් කර ඇති අතර "ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් සඳහා තැපැල් පහසුකම්" යන වැකිය සිංහල දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් මුද්‍රණය කර තිබේ. මෙම මුද්දර කාණ්ඩය කාර්තුවකට මුද්දර මිලියන දෙක බැගින් නිකුත් කරනු ලැබේ. (අනාගතයේ දී ඔබට ඇමතිකමක් ලැබුනොත් ඒ මිලියනයේ වාසනාව ඔබටත් අත්වනු ඇත).

✍ සිරිල් පෙරේරා

## චතාරික ළමා ක්‍රියාකාරකම්

### රත්මලාන රෝමානු කතෝලික විදුහල

රත්මලාන ශාන්ත මරියා දේවස්ථානයේ දි රත්මලාන රෝමානු කතෝලික විදුහලේ හා ගල්කිස්ස ඇතුලත් මුදලි විදුහලේ කතෝලික දරුවන්ගේ සහභාගිත්වයෙන් පාද නමස්කාරයක් පැවැත්විණි.

පාද නමස්කාර ස්ථානයන් මෙනෙහි කිරීම මොරටුව ශාන්ත සෙබස්තියන් විදුහලේ ගරු දයා දර්ශන පියතුමන් විසින් සිදු කළ අතර පාසලේ කතෝලික ධර්ම ආචාර්ය අසික ප්‍රියදර්ශන මහතාද මීට එක්විය. මෙම අවස්ථාවට පාසලේ විදුහල්පතිනිය ඇතුළු කතෝලික ගුරුවරුන් සහභාගි විය. මෙය පාසලේ කතෝලික සංගමය විසින් සංවිධානය කරන ලදි.



# අනූන්ට උපකාර කරමු

සඳරුවන් දෙවෙනි ශ්‍රේණියේ ඉගෙන ගන්නා ළමයෙක්. ඔහුගේ හොඳම මිතුරා වූයේ ලක්සිරියි. දවසක් පාසල අවසන්වී නිවසට ආ සඳරුවන්ගෙන් ඔහුගේ අම්මා පාසල් වැඩ කටයුතු ගැන විමසුවා. තමා එදින පන්තියේ කළ වැඩ ගැන විස්තර කළ සඳරුවන් , ''අම්මේ , මං ඉස්කෝලෙ වැඩ ටික හොඳට කළාට ලක්සිරි නැති නිසා මට හරිම පාලුවක් දැණුනා.''

''ඇයි පුතාගේ යාලුවාට අසනීප වෙලාද?''

''කවුරුත් දන්නේ නෑ අම්මේ ඇයි ලක්සිරි ඉස්කෝලෙට එන්නේ නැත්තේ කියලා ''

''ඉන්නකෝ පුතා, මං හවසට ඔයාගේ ගුරුතුමියට කතා කරලා අහන්නම්කෝ'' කියා සඳරුවන්ගේ අම්මා ඔහුට කීවා.

සවස් වරුවේ සඳරුවන්ගේ අම්මා පන්ති භාර ගුරුතුමියට දුරකථනයෙන් කතා කළා. තම මවගේ මුහුණ කනගාටුවෙන් පිරී යන බව දුටු සඳරුවන්ගේ සිතට බයක් ඇති වුනා. තම මව ගුරුතුමිය සමඟ කළ කතාවෙන් පසු ඇය කල්පනාකාරීව සිටින බව දුටු සඳරුවන් අම්මා ළඟට හෙමින් පැමිණියා. ''අම්මේ , මොනවාද කුමාරි මිස් කීවෙ?'' සඳරුවන් ඇසුවා.

සඳරුවන් තුරුලු කර ගත් මව ''අනේ පුතා , ලක්සිරිලගෙ පවුලට හරි කරදරයක්නේ වෙලා තියෙන්නේ. ඉරිදා රෑ එයාගේ ලොකු අක්කල පවුලේ සේරම ළමයින්ගේ යුනිපෝම් ටික මැදල සාලේ මේසෙ උඩ තියලා නිදා ගන්න ගිහිල්ලා තියනවා. මහ රෑ හොරු වගයක් සාලේ දොර ඇරල ගෙට ඇවිල්ලා අර යුනිපෝම් ටිකයි, තවත් මොනවාදෝ සාලේ තිබුණ බඩු වගයකුයි අරන් ගිහින්. උදේ නැගිට්ටම තමයිලු දන්නේ රෑ හොරු ඇවිදින් කියලා. දැන් කාටවත් ඉස්කෝලෙට යන්න අඳින්න යුනිපෝම් නැතිලු''.

''අයියෝ හරි පවුනේ දැන් ලක්සිරි කොහොමද ඉස්කෝලෙට එන්නේ? ''

'' ඒක තමයි මමත් මේ කල්පනා කළේ.'' මව සඳරුවන්ගේ ඔලුව අතගෑවා. තරමක් වෙලා නිහඬව සිටි මව මෙසේ කීවා. ''පුතා මට අදහසක් ආවා. හැබැයි ඒ අදහස හරියට කරන්න නම් පුතාගෙනුත් ලොකු සහයෝගයක් ඕනෑ.''

''මං මොනවද අම්මේ කරන්න ඕනේ? මං ඕන දෙයක් කරන්නම් ලක්සිරිට. මට හරි දුකයි, ඒවාගේම පාලුයි ලක්සිරි පන්තියේ නැතිව මාත් එක්ක සෙල්ලම් කරන්න''
''මගේ පුතා කැමතිද පුතාගේ යුනිපෝම් දෙකෙන් එකක් ලක්සිරිට දෙන්න''

''එතකොට අම්මේ මට එකනෙ තියෙන්නේ''

''ඒක ඇත්ත තමා ... නමුත් ඔයාගේ හොඳම යාලුවට දැන් එකක්වත් නෑනෙ.''

''ආ ... එහෙනම් මං එකක් දෙන්නං '' සඳරුවන් බොහොම කැමැත්තෙන් කීවා.

''මගෙ හොඳ පුතා. හැබැයි පුතා ප්‍රශ්නෙ තියෙන්නේ පුතාට පුලුවනිද එක යුනිපෝම් එක කිළිටි කර ගන්නේ නැතිව දවස් දෙකක්වත් අඳින්න. අනික පුතා වැඩිය ඇඳුම් ජරා කර ගන්න ළමයෙකුත් නෙමේනෙ. මට පුලුවන් බදාදා විතර යුනිපෝම් එක ආයිමත් හෝදන්න. පුතා කැමති ද උත්සාහ කරල බලන්න?''

''ඔව් අපි උත්සහ කරල බලමු. මං පරිස්සමින් යුනිපෝම් එක කිලිටි වෙන්නෙ නැතිවෙන්න සෙල්ලම් කරන්නම්. යුනිපෝම් එකක් තියනව නම් ලක්සිරිටත් ඉස්කෝලෙට එන්න පුලුවන්නෙ. එතකොට එයාටයි මටයි ආයිමත් සෙල්ලම් කළෑකි.'' සඳරුවන්ගේ මව පන්ති භාර ගුරුතුමියගෙ මාර්ගයෙන් ඔහුගේ එක් පාසල් නිල ඇඳුම් කට්ටලයක් ලක්සිරිගේ ගෙදරට යැව්වා. ඒ හේතුවෙන් පසුදා සිට ලක්සිරිට පාසලට එන්නට හැකි වුනා.

පොරොන්දු වූ පරිදි සඳරුවන් තම පාසල් නිල ඇඳුම් කට්ටලය කිළිටි කර ගත්තේ නැහැ. ඒ අවුරුද්ද අවසාන වන තුරුම ඔහු තමාට ඇති එකම නිල ඇඳුම් කට්ටලයෙන් සැරසී පාසල් යාමට පුරුදු වුනා.

මෙම කටයුත්ත කර ගෙන යාම තරමක් අපහසු කාර්යයක් වුවත්, සුලු පමණින් හරි තමාට හැකි අයුරින් බැරි කෙනෙකුට උදව් කිරීම කෙතරම් වටිනා ක්‍රියාවක් දැයි ආදර්ශයෙන්ම සඳරුවන්ට අවබෝධ කර ගැනීමට හැකි වීම ගැන මවගේ සිත තුළ ඉතා තෘප්තිමත් හැඟීමක් පහළ වුණා.

✍ ෆ්‍රීඩා විල්ලවරායන්




ඔබෙ අත අල්ලාගෙන මුහුදේ රළ මත
ඇවිදින විට පා සලකුණු සතරක් දුටුවේ
ඔබෙ සෙනෙහස දකිමින් සුසුමක් ගන්නට
කලියෙන් ඔබෙ අත අතහැර මා වැටුණේ
බාධකයට පැටලී ඔබේ ආදරේ නව පණක්
ලබන්නට මගෙ අත අල්ලාගන්න ජේසුනී

**ක්‍රිස්ටිනා පෙරේරා**
08 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල - බටගම

**තරුවි විභූෂා** - 09 ශ්‍රේණිය
කටුකුරුන්ද දහම් පාසල
(කලමුල්ල මීසම)

ඔබගේ දහම ගෙනයන්නට ආසයි
ඔබගේ විශ්වාසය රැකදෙන්නට ආසයි
ඔබගේ සාමය ලොවට බෙදන්නට ආසයි
සැමදා යහපත් ලෙස ජිවත් වන්නට ආසයි

ජේසුනි මා ඔබේ සේවකයෙකි සැමදා
ඔබ පසු පස මා යමින් ඔබේ ගුණ
සැමතැන පතුරවමින් මම වෙමි
ඔබේ දරුවෙක්

මා පිය හට ගරුකරමින් සමිඳුගේ ආදරයෙන්
සුරකිමි සමිදුනි ගුණ සැමදා
ජීවිතය මට දුන්නේ ඔබමයි සමිඳේ
සමිඳුගේ සේවනේ ඉන්නට සැමදා
දෙන්න වරම් දෙව්දේ

**දිල්කි මල්ෂා**
11 ශ්‍රේණිය
ශා. අන්තෝනි දහම් පාසල - කිරාගාර (ගෝනවිල මීසම)

සැබෑ මිදිවැල මමයි කියූ ජේසුනි
ජීවනය හෝජනය වන මාගේ ජේසුනි
ජීවිතයේ දුක සතුට ඔබට භාර දෙමි ජේසුනි
නපුරෙන් රැක ගනු මැන මා ජේසුනි

**සචිනි භාග්‍යා තිසේරා**
09 ශ්‍රේණිය
සිංදාත්‍රිය දහම් පාසල - (වයික්කාල මීසම)



**මාසික සිතිවිල්ල**

**මාසික සිතිවිල්ල**
"අප්‍රේල් මාසය"
ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය
මාවත,
කොළඹ 08.

**සේයා : ටෝනි නිශාන්ත - මහවැව**

මනහර ලොවට අප මැව්වේ ඔබමයි දෙව්දේ
දුබල අපට සමාව දෙන්නේ ඔබයි දෙව්දේ
ලෝක අන්ධකාරයෙන් ගලවා ගන්නේ ඔබයි දෙව්දේ
ඒ ඔබ ආදරයේ උල්පත වන නිසයි දෙව්දේ

**චමෝදි පැතුම් අබේරත්න**
08 ශ්‍රේණිය
කිතු දහම් පාසල - පල්ලන්සේන

# 2013 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## පළමු තේමාව ඇසුරෙන් පළවූ ප්‍රශ්න වලට පිළිතුරු

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

52. භෞතික ලෝකය තුළින් - පුද්ගලයා තුළින්

53. රතු මුහුදින් එතෙර වීම.

54. උත්පත්ති
i) පළමු - පූජක ( P ) - ii) දෙවන - යාවිස්ත ( J )

iii දෙවියන් වහන්සේ තම ස්වරූපයට හා සමානකමට අනුව මිනිසා මැවූ සේක.
★ මිනිසා මවා ඇත්තේ හයවන දවසේදීය
★ මනුෂ්‍යයා මවා ඇත්තේ ඔහුට ජීවත් වීමට අවශ්‍ය භෞතික පරිසරය සකස් කළ පසුය.
★ මිනිසා ශ්‍රේෂ්ඨතම මැවිල්ල නිසා අනෙක් මැවිලි පාලනය කරයි. එනම්, භෞතික ලෝකයේ ආධිපත්‍ය මිනිසාට පවරා දුන් සේක.
★ දෙවියන් වහන්සේ දින 06 කින් ලෝකය මවා, සත්වන දිනයට ආසිරිපතා එය ශුද්ධ දවසක් ලෙස වෙන් කිරීම

iv) ★ මෙය යාවිස්ත සම්ප්‍රදායට අයිති වූවකි.
★ දෙවියන් වහන්සේ ලොවේ දූවිල්ලෙන් මනුෂ්‍යයා මවා ජීවන හුස්ම දී ඔහු ජීවමාන කළ සේක.
★ දෙවියන් වහන්සේ හෙළු ජීවන හුස්ම ආධ්‍යාත්මික දෙයකි. දූවිලි භෞතික ලෝකයට අයිතිය.
★ එබැවින් මිනිසා තුළ භෞතික මෙන්ම ආධ්‍යාත්මික ශරීරයක් තිබේ.
★ මැවීමේ කතා පුවත දින හතකින් යුක්ත නොවේ

v) මිනිසාට ජීවන හුස්ම ලබාදීම
★ මිනිසාට අවශ්‍ය සියලු දේ ලබාදීම (ඒදන් උයන)
★ මැවිල්ලේ පාලනය භාරදීම
★ නිතර මිනිසා සමග කතා කිරීම , සෙවීම
★ මිනිසා ඇත් වුවද, දෙවියන් වහන්සේ ඔවුන් අත් නොහැර සිටීම.

55. i) එතෙරවීම

ii) ★ ගඩොල් කර්මාන්තය ★ කුඹල් කර්මාන්තය
★ කෙත් වල විවිධ කෘෂිකර්මාන්තය

iii) ★ රතු මුහුද තරණය ★ කාන්තාරයේදී ජලය ලැබීම
★ ගිනි ටැඹ හා වළා ටැඹ මගින් මග පෙන්වීම
★ ආහාර වශයෙන් මන්නා සහ වටුමස් ලැබීම
★ සීනායි ගිව්සුම හෙවත් දස පනත ලැබීම

56. i) දෙවියන් වහන්සේ වෙනුවෙන් ජනතාවට කතා කරන්නෙකි
ii) යෙසායා , ජෙරමියා , එසකියෙල්

iii) ★ දර්ශනය හා විශේෂ අත් දැකීම
★ කැඳවීම භාර දීම ★ දිවැසිවරයාගේ අකමැත්ත
★ ධෛර්යවත් කිරීම ★ යවනු ලැබීම



"මදර් ශ්‍රී ලංකා" වැඩ සටහනට සමගාමීව මොරටුව ජයලත් අප ස්වාමිදුගේ කන්‍යාරාම සිසුවියන් පසුගියදා මොරටුව ලුනාව ආයුර්වේද රෝහල් භූමියේ ඔසු පැළ සිටුවීමේ ව්‍යාපෘතියක් සිදු කරන ලදි. විදුහල්පති ගරු සුජීවා නෝනිස් මව්තුමියගේ උපදෙස් හා සහභාගීත්වයද සහිතව සිදු කෙරුණු මෙම වැඩ සටහනට ආයුර්වේද වෛද්‍ය ශිරෝමි මිය හා කාර්ය මණ්ඩලය එක් විය. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ. **සුමිත් මාර්ක් ද සිල්වා**

# ඔබත් හොඳට හැදිච්ච දුවෙක් වෙන්න



ආදර චූටි දුවේ, මෙම ලිපිය ලියන්නේ විශේෂයෙන් චූටි දුවලටයි, ඒ වගේම චූටි පුතාලටත් මේ ලිපිය හරියට වටිනවා. සමාජයෙ මතයක් තියෙනවා `` හොඳට හැදිච්ච දුවෙක් ඉන්න නිවසකට ගොඩවන්නට ඇතුල් වෙනකොටම, ඒ බව දැනෙනවා කියලා.

නිවස ගෙවත්ත දිහා බලනකොටම තේරෙනවාලු මේ ගෙදර අනිවාර්යයෙන්ම හොඳ ගැහැනු දරුවෙක් සිටිනවා කියලා . ඒකේ තේරුම. පිළිවෙලට හැදිච්ච දියණියක් ඉන්න ගෙදර පිලිවෙලයිලු. ගෙදර තියෙන හොඳම පිරිසිදු , නිසි පිලිවෙලට තියෙන කාමරය අනිවාර්යයෙන්ම ඒ දුවගෙලු මොකද ඒ කාමරයෙ අනවශ්‍ය දේවල් නෑ. මකුළු දැල්, දුවිලි, කිලුටු නෑ. අවශ්‍යම දේවල් ලස්සනට පිළිවෙලට තියෙනවාලු.

දැනට අවුරුදු 50 කට පමණ ඉස්සෙල්ල දුවේ පුතේ අපේ රටේ අද වාගේ රූපවාහිණී, පරිඝණක, ලැප්ටොප්, ජංගම දුරකථන , Face BooK පහසුකම් ආදිය තිබුනෙ නැහැ. ඉතිං ඒ දවස් වල අපේ දුවල පුතාලට හරියට විවේක තිබුනා.

ඉතින් දුවේ පුතේ අද වන විට ඒ සියල්ලම අපගෙන් දුරස් වෙලා. ඒ මොකද රූපවාහිණියෙ නාට්‍ය, කාටූන්, පරිඝනකය , ලැප්ටොප්, ජංගම දුරකථන , Face BooK ආදියට දුවල පුතාල හොඳටම ඇබ්බැහි වෙලා නිසා Computer Games , SMS නිසා දරුවන් දැඩි ලෙස අයාලේ ගිහිල්ල මොකද ඒ අයට මෙලෝ සිහියක් නෑ, පාසල් ඇරිලා ගෙදරට ගොඩවෙන්නේ එක්කෝ Cartoon බලන්නට නැත්නම් Computer Games සෙල්ලම් කරන සිහියෙන්. ඉතින් මේ සෙල්ලම් නිසා ඔයාලට කිසිම විවේකයක් නැතුව පැය ගණන් එකම තැන ඉඳගෙන සිටින නිසා ඇඟපත මහත් වෙලා ඇස් පෙනීම දුර්වල වෙලා නැති ලෙඩ රාශියක් තරුණ වියට එළඹෙන්නට පෙරම ශරීරයට ලංකර ගන්නවා.

ඉතින් දුවේ පුතේ මම මුලදී කිව්ව වාගෙ තමන් නිදන යහන, කාමරය , ඇඳුම් අල්මාරිය , ගෙදර , ගෙමිදුල , ගෙවත්ත ලස්සනට තියෙනවානම් ඒ තැන්වලට තමයි ජේසුගේ බැල්ම නිතරම හෙලන්නේ. ජේසු වඩින්නෙත් ඒ වගේ තැන්වලට විතරයි. ජේසු නිතරම ඒ වාගෙ තැන්වලට ලංවෙනවා.

ඉතිං අනවශ්‍ය දේවලට සිත් යොමු නොකොට, අනවශ්‍ය දේවල් , යාළුවෝ, වැඩසටහන් ඔබගෙ ජීවිතයෙන් ඉවත්කොට ස්වභාව ධර්මයත් සමඟ සිටියොත් පාඩමටත්, අධ්‍යාපනයටත් මනස පෑදේවි. වසර අවසානයේදී විභාග ප්‍රතිඵලත්, ශරීර සෞඛ්‍යයත් යහපත් වේවි. ඒ නිසා අද ඉඳලම මේ වැඩ පිළිවෙල ක්‍රියාවට නංවන්නට වෙර දරන්න. යහපත් , බුද්ධිමත්, සෞඛ්‍ය සම්පන්න දරුවෙක් වෙන්නට වෙර දරන්න.

ජෝ. පාරිස් මාමා - වැලිවිට

# කතෝලික සභා

### හැඳින්වීම

කතෝලිකයන් වන අප, ජේසු සමිඳුන් ස්ථාපිත කළ එකම ශුද්ධවූ සභාව තුළින් බෞතිස්ම ස්නාපනය ලබා ගැනීමට තරම් අති සුවිශේෂ වරම් සම්භාරයක් දෙවියන් වහන්සේ ගෙන් ලබා ඇත. මෙම සත්‍යතාවය ශුද්ධවූ ජොහාන් තුමා මෙසේ සනාථ කරයි. *"බලන්න, පියාණන් වහන්සේ අපට කෙතරම් ප්‍රේම කර ඇද්ද? අපි දෙවියන් වහන්සේගේ දරුවෝ යයි කියන තරමට උන්වහන්සේ අපට ප්‍රේම කළ සේක. ඇත්තෙන්ම අපි උන්වහන්සේගේ දරුවෝම ය."* (ජොහාන් 3:1). පහත සඳහන් ප්‍රශ්න සහ පිළිතුරු මගින්, කතෝලික සභාවේ බයිබලීය සහ සාම්ප්‍රදායික පදනම ද, එහි විශිෂ්ටත්වය ද, දේව වචනය සුරැකිව එය ලොවට ප්‍රකාශ කිරීම සඳහා ශුද්ධවූ සභාව විසින් දෙන ලද නිම කළ නොහැකි අගනා දායකත්වය ගැන ද සත්‍ය කරුණු වටහා ගනිමින්, ශුභාරංචිය ලොව පුරා පතළ කිරීම සඳහා ශුද්ධවූ සභා මාතාව වෙත ජේසු සමිඳුන් පැවරූ වගකීම (මතෙව් 28:18-20/ මාක් 16:15/ ලූක් 24:47-49/ ජොහාන් 20:21/ ක්‍රියා 1:8) ඉටු කිරීම වෙනුවෙන් අපගේ සම්පූර්ණ සහයෝගය දෙමින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දූත කාර්යයේ ක්‍රියාශීලි පංගුකාරයන් වීමට අපි සියලුදෙනා අධිෂ්ඨාන කර ගනිමු.

**1. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කළේ එක් සභාවක් ද නැතහොත් සභාවන් කීපයක් ද?**

මතෙව් තුමාගේ සුවිශේෂයේ 16 පරිච්ඡේදයේ 18 වගන්තියේ සඳහන් වන පරිදි ක්‍රිස්තුන් වහන්සේ ස්ථාපිත කළේ එක් සභාවක් පමණි.

**2. ක්‍රිස්තුන් වහන්සේගේ සභාවේ සභිකයන් කවුද?**

සභාවක හෝ සමාජයක සභිකයන් අංශ තුනකට වෙන් කළ හැකිය. එනම් i. සාමාන්‍ය සභිකයන්, ii. නිලධාරින්, iii. නායකයා. මේ අංශ තුනෙන් යුත් සභාවක් ක්‍රිස්තුන් වහන්සේ පිහිටුවූ බව ශුද්ධ බයිබලයෙන්ම ඔප්පු වේ. ක්‍රිස්තුන් වහන්සේගේ අනුගාමිකයන් අතරෙන්, ඇතැමෙක් ශ්‍රාවකයන් වීම සඳහා උන්වහන්සේ විසින්ම කැඳවන ලදි. (මතෙව් 4:18-22/ මතෙව් 9:9 / ලූක් 5:1-11). මොවුන් අතරින් දොළොස් දෙනකු තෝරාගෙන ඔවුන්ට ප්‍රේරිතයෝ (හෙවත් අපෝස්තුළුවරු) යන නම තැබූහ - (ලූක් 6:12-16). මෙම දොළොස්දෙනාගේ නම් නව ගිවිසුමෙහි ග්‍රන්ථවල සඳහන් කර තිබීමෙන් පෙනෙන්නේ ඔවුන්ගේ තත්ත්වය උසස් කොට සලකන ලද බවය. (මතෙව් 10:2-4 / මාක් 3:16-19/ ලූක් 6:14-16 / ක්‍රියා 1:13). අන්‍ය ශ්‍රාවකයන් හැත්තෑ දෙනෙක් ද සිටියහ - (ලූක් 10:1. ක්‍රිස්තු අනුගාමිකයන් අතර කාන්තාවෝ ද වූහ (මාක් 15 : 40 -41 / ලූක් 8:1-3). ප්‍රේරිතයන් දොළොස් දෙනා අතරින් නායකයකු ද උන්වහන්සේ පත් කළ සේක.

**3. ක්‍රිස්තුන් වහන්සේ පත් කළ සභා නායකයා කවුද?**

ශුද්ධවූ සභාවේ නායකයා ලෙස උන්වහන්සේ සීමොන් පේදුරු පත් කළ සේක.

*"ජෝනාගේ පුත් සීමොන් .... ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනඟන්නෙමි. පාතාලයේ දොරටුවලට වුවද, එය පරාජය කළ නොහැකි ය. ස්වර්ග රාජ්‍යයේ යතුරු ඔබට දෙන්නෙමි. ඔබ පොළොවෙහි දී යමක් බඳින්නෙහි ද, එය ස්වර්ගයෙහි දී බඳිනු ලබන්නේ ය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නෙහි ද එය ස්වර්ගයෙහි දී මුදනු ලබන්නේ ය."* (මතෙව් 16:17-19).

**4. ක්‍රිස්තුන් වහන්සේ වදාළ (ඉහත සඳහන්) වචන වලින් හෙළිවන වැදගත් කරුණු මොනවාද?**

i. මෙවැනි ප්‍රකාශයක් කරන ලද්දේ එක් ශ්‍රාවකයකු සම්බන්ධයෙන් පමණි.

ii. උන්වහන්සේ සීමොන් නම් වූ එතුමන්ට පර්වතය යන අර්ථය ඇති "පේදුරු" යන අලුත් නමක් ද දුන් සේක. මෙම පර්වතය කෙතරම් ශක්තිමත් වන්නේ ද කිවහොත්, එය පිට ක්‍රිස්තුන් වහන්සේ ගොඩනඟන ශුද්ධවූ සභාව පරාජය කිරීමට මනුෂ්‍යයන් නිත්‍ය මරණයට පත් කළ හැකි බලවේගයන්ටවත් නොහැකි වන්නේ ය.

iii. *"ස්වර්ගයෙහි යතුරු ඔබට දෙන්නෙමි"* - මනුෂ්‍යයන් ස්වර්ගයට ගෙන යෑම සම්බන්ධයෙන් අසහාය වගකීමකුත් බලයකුත් මේ වචන වලින් පේදුරුතුමන්ට පැවරේ.

iv. *"ඔබ පොළොවෙහි දී යමක් බඳින්නෙහි ද.... මුදන්නෙහි ද..."* - මෙම වචන වලින් පේදුරු තුමන්ගේ ආගමික පාලන බලය වඩාත් තහවුරු වන අතර, එය ක්‍රියාත්මක වීමේදී එතුමාට නොමඟ යාමට ඉඩ නොතිබෙන බව ද ප්‍රකාශ වේ. මෙලොවෙහි දී බඳින හෝ මුදන කිසිවක් ස්වර්ගයේ අනුමත වන්නට නම්, එය නිවැරදි විය යුතුය. එබැවින් බඳින හෝ මුදන බලය භාවිත කිරීමේදී පේදුරු තුමන්ට වරදින්නට දෙවියන් වහන්සේ ඉඩ නොදෙන සේක. එනම්, එතුමාට තම ලෝකෝත්තර කාර්යය සම්බන්ධයෙන් නොවරදින සුළු බවක් ලැබෙන්නේ ය.

**5. ක්‍රිස්තුන් වහන්සේ පේදුරු තුමන්ගේ නායකත්වය සනාථ කරන අනිකුත් අවස්ථාවන් නම් කරන්න.**

1. *"සීමොන්, සීමොන්.... ඔබේ සහෝදරයන් ධෛර්යවත් කරන්නැ"* (ලූක් 22:31-32).

2. *"...සීමොන්, මොවුන්ට වඩා ඔබ මට ප්‍රේම කරන්නෙහිද?.... මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්නැ.... මාගේ බැටළුවන්ගේ*

# වේ විශිෂ්ටත්වය

*එඬේරා වෙන්න.... මාගේ බැටළුවන් පෝෂණය කරන්න"* (ජොහාන් 21:15-17). (ඉහත සඳහන් ප්‍රකාශයන් කරන ලද්දේ පේදුරු තුමන් වෙත පමණි.)

**6. ශ්‍රාවකයන් අතරෙන් පේදුරු තුමා ප්‍රමුඛ ස්ථානය ලබා සිටි බව සනාථවන තවත් අවස්ථාවන් කවරේද?**

i. ක්‍රිස්තුන් වහන්සේ තම ගෝලයන්ගෙන් *"මනුෂ්‍ය - පුත්‍රයාණෝ කවරෙක් ය කියා මිනිස්සු කියත් ද"* යි සිය ශ්‍රාවකයන්ගෙන් ඇසූ විට, එයට පිළිතුරු දුන්නේ පේදුරු තුමන්ය. - (මතෙව් 16:13-16/මාක් 8:27-29 / ලූක් 9:18-20).

ii. ක්‍රිස්තුන් වහන්සේ කපර්ණාවුමේ දී තමන් වනාහි *"ස්වර්ග යෙන් පහළ වූ භෝජනය"* බව පවසා දේශනා කළාට පසුව උන්වහන්සේගේ ගෝලයෝ බොහෝ දෙනෙක් උන්වහන්සේ අනුව නොගියහ. එවිට උන්වහන්සේ ශ්‍රාවකයන් දෙලොස් දෙනාගෙන් *"ඔබත් ඉවත් ව යන්නට සිතන්නහු ද"* යි ඇසූ කල එයට පිළිතුරු දුන්නේ පේදුරු තුමන්ය. (ජොහාන් 6:35-69)

iii. ජායිරස්ගේ දුව මරණින් නැගිටවීම දැකගැනීමටත් (මාක් 5:21-43) ක්‍රිස්තුන් වහන්සේගේ රූප විපර්යාසය සිදුවූ මොහොතේ උන්වහන්සේගේ තේජශ්‍රීය දැක ගැනීමටත් (ලූක් 9:28-36) , උන්වහන්සේගේ අන්තිම රාත්‍රි භෝජනයෙන් පසුව ගෙත්සෙමනි උයනට ගියවිටත් (මතෙව් 26:36-37), උන්වහන්සේ ගෙනගියේ පේදුරු සහ සෙබදිගේ පුත්‍රයන් වූ ජාකොබ් සහ ජොහන්ය.

iv. උත්ථානවූ කිතු සමිඳුන් තම ශ්‍රාවකයන් අතර පළමුව දර්ශනය වූයේ පේදුරු තුමන්ටය. (ලූක් 24:34)

v. කිතු සමිඳුන්ගෙ මෘත දේහය තැන්පත් කළ සොහොන් ගේ ළඟට පැමිණි ස්ත්‍රීන් තිදෙනාට හමුවූ දේව දූතයා, කිතු සමිඳුන්ගේ උත්ථානය ශ්‍රාවකයන්ට දන්වන්න යි පවසද්දි නම් කළේ පේදුරු තුමන් පමණක් ය (මාක් 16:7)

**7. කිතු සමය ආරම්භයේදී අන් කිතුනු ශ්‍රාවකයන් සහ සාමාන්‍ය ක්‍රිස්තු අනුගාමිකයන්, ක්‍රිස්තුන් වහන්සේ අදහස් කළ පරිද්දෙන්ම පේදුරු තුමා තමන්ගේ නායකයා වශයෙන් සැලකූ බවට ශුද්ධ බයිබලයේ ඇති සාක්ෂි කුමක්ද?**

i. අපෝස්තුළුවරුන්ගේ නාමාවලිය සඳහන් කෙරෙන සෑම විටම මුලින්ම සඳහන් වන්නේ පේදුරු තුමාගේ නම ය. (මතෙව් 10:2-4/ මාක් 3:16-19 / ලූක් 6:14-16 / ක්‍රියා 1:13).

ii. කිතු සමිඳුන්ගේ සොහොන් ගේ ඇතුලට පළමුව පිවිසුනේ පේදුරු තුමන්ය. (ජොහාන් 20:3-8)

iii. ජුදස්ගේ තැනට මතියස් තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් මූලිකව ක්‍රියා කළේ පේදුරු තුමාය. (ක්‍රියා 1:15-26).

iv. ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රිස්තු ශ්‍රාවකයන් මත බැස වදළ අවස්ථාවේ රැස්ව සිටි ජනයා ඇමතුවේ පේදුරු තුමන් ය (2:14-41)

v. අනනියස් සහ සපිරා යන අඹු සැමි දෙදෙනාගේ වංචාව ගැන ඔවුන්ට දරුණු දඬුවම් දෙන ලද්දේ පේදුරු තුමන් විසිනි. (5:1-11)

vi. එතුමන්ගේ සෙවණැල්ල වැටීමෙන් වුවද රෝගීන් සුව විය (ක්‍රියා 5:15)

vii. ජුදෙව්වරුන් නොවන අය ක්‍රිස්තු භක්තිකයන් වූ විට , චර්මඡේදන පිළිවෙත හා මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව ඔවුන් පිළිපැදිය යුතුද යන ප්‍රශ්නය පිළිබඳව ජෙරුසලමෙහි පවත්වන ලද සම්මන්ත්‍රණයේදී මුල් තැන ගෙන ක්‍රියා කළේ පේදුරු තුමාය. (ක්‍රියා 15:1-21).

viii. උත්ථානවූ ක්‍රිස්තුන් වහන්සේ ගෝලයන් අතරින් පළමුවෙන්ම දර්ශනය වූයේ පේදුරු තුමාට බව පාවුලු තුමා පවසයි. (1 කොරින්ති 15:3-5)

ix. කිතු දහම වැළඳ ගෙන වසර තුනක් ගතවූ පසු, පාවුලු තුමා ජෙරුසලමට ගියේ අන් අපෝස්තුළුවරුන් නොව, පේදුරු තුමන් හමුවීමට ය. (ගලාති 1:18)

x. ක්‍රියා පොතේ 1 සිට 15 පරිච්ඡේදවල පේදුරුතුමන්ගේ ප්‍රමුඛත්වය ගැන බොහෝ තැන්වල සඳහන් වේ - (උදා 1:15 / 2:14 / 3:4 / 4:8 / 5 :3 / 5:29 / 8:20 / 9:32, 38 / 10:13,32,34,44,47 / 11:4 /12:5).

**ලබන සතියට....**

**✍ වික්ටර් සිල්වා**



# ඉංග්‍රීසි පාඩම විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ) සිසු සිසුවියන් සඳහා

ඉදිරිපත් කිරීම මයිකල් ඇන්ජලෝ ප්‍රනාන්දු විසිනි.

පාඩම් අංක : 92

## යම් ක්‍රියාවක අරමුණ ප්‍රකාශ කෙරෙන ඉංග්‍රීසි යෙදුම් In order to / so as to

අපි කරන යම්කිසි ක්‍රියාවක අරමුණ ගැන ප්‍රකාශ කිරීමේදී අපි ඉංග්‍රීසියේදී යොදන යෙදුම් දෙකක් තමයි.
**"In order to"** (ඉන් ඕඩ(ර්) ටූ) සහ **"So as to"** (සෝ ඇස් ටූ)

මේ යෙදුම් දෙකටම යම් ක්‍රියා පදයක වර්තමාන ස්වරූපය එකතුවිය යුතුයි.
In order to + see so as to + see යනාදි වශයෙන්.
අපි නිදසුන් ඇසුරෙන් මේ යෙදුම් ගැන ඉගෙන ගනිමු.

1. He took the course **in order to get** a better job.
(හී ටුක් ද කෝස් ඉන් ඕඩ(ර්) ටු ගෙට් අ බෙට(ර්) ජොබ්)
ඔහු මේ පාඨමාලාව කලේ වඩා හොඳ රැකියාවක් ලබාගැනීම අරමුණු කරගෙනයි.

2. Trees are planted by the roadside **so as to reduce** traffic noise.
(ට්‍රීස් ආ(ර්) ප්ලාන්ටඩ් බයි ද රෝඩ් සයිඩ් සෝ ඇස් ටු රිඩියුස් ට්‍රැෆික් නොයිස්) පාර අයිනේ ගස් සිටුවා තිබෙන්නේ වාහන වලින් නැගෙන ශබ්දය අඩුකර ගැනීමටයි.

සාමාන්‍යයෙන් කතා කරන ඉංග්‍රීසියේදී මේ **In order to** හෝ **So as to** යන යෙදුම් නොමැතිව **to** පමණක් යොදලත් කියනවා. ඒත් ඒ අදහසම කියැවෙනවා කිසිවෙනසක් නැතුව.
අපි ඉහත සඳහන් කළ වාක්‍ය දෙක මේ විදිහටත් ලියන්න පුළුවන්.

3. He took the course **to** get a better job.
4. Trees are planted by the roadside **to** reduce traffic noise. දැන් අපි තව වාක්‍ය කීපයක් අධ්‍යයනය කරමු මේ අදහස අවබෝධ කරගැනීමට.
5. මට බිස්නස් එකක් පටන් ගැනීම සඳහා බැංකුවෙන් මුදල් ටිකක් ගන්න සිදුවුණා.

මේ වැකිය අපි ඉංග්‍රීසියෙන් ලියමු. මේක ඉහත අපි ඉගෙන ගත්තු ක්‍රම තුනෙන්ම ලියන්න පුළුවන්. අදහසේ කිසිම වෙනසක් නැතුව.
(a) I had to borrow money from the bank **in order to start** a business.
(b) I had to borrow money from the bank **so as to start** a business.
(c) I had to borrow money from the bank **to start** a business.

අපි තව වැකි කීපයක් මේ විධි තුනෙන්ම ලියමු.

6. වාහන තදබදය වළක්වාගන්න නිසා මම වේලාසනින් ගියා.
(a) I went early **in order to avoid** traffic.
(b) I went early **so as to avoid** traffic.
(c) I went early **to avoid** traffic.

7. පොදු ප්‍රවාහනයට මිනිසුන් දිරිමත් කිරීම සඳහා බස් ගාස්තු අඩුකරලා.
(a) Bus fares are cut **in order to encourage** people to use public transport. (b) Bus fares are cut **so as to encourage** people to use public transport. (c) Bus fares are cut **to encourage** people to use public transport.

8. ඔහුගේ බැල්ම වළක්වා ගැනීමට ඇය පොත දිහා බලාගෙන හිටියා.
(a) She looked down at the book **in order to avoid** his gaze.
(b) She looked down at the book **so as to avoid** his gaze.
(c) She looked down at the book **to avoid** his gaze.

යමක් සිදු නොවීම පිණිස කියන අදහස සඳහා අපි මේ වාක්‍ය ඛණ්ඩ වලට not එකතු කරනවා. ***In order not to So as not to*** යනාදි වශයෙන්.

**නිදසුන්:**

9. අපි මුවා ළඟට හෙමින් ගියේ , ඌ බය වෙලා දුවන්නෙ නැතිවෙන්න (නොදුවන පිණිස)
(a) We walked quietly towards the deer ***in order not to*** frighten him away.
(b) We walked quietly towards the deer ***so as not to*** frighten him away. නමුත්
(c) We walked quietly towards the deer ***not to frighten*** him away.
කියන වැකිය දිහා අවධානයෙන් බලන්න.

අනිත් (a) සහ (b) වලට වඩා තරමක් වෙනස් අදහසක් ඉන් කියැවෙනවා. ඒකෙන් (c වැකියෙන්) කියැවෙන්නේ, "අපි මුවාට හෙමින් ලං වුනේ ඌ බය වී පැන නොයනු පිණිස" කියන අදහස නෙමේ. ඉන් ප්‍රකාශ වෙන්නෙ,"අපි මුවාට හෙමින් ලං වුනේ ඌව පලවා හැරීමට නොවේ" කියන අදහසයි.

ඒ නිසා not යෙදීමේදී ඉන් ප්‍රකාශ වන අදහස හොඳින් තේරුම් ගන්න (In order not to + ක්‍රියාව) සහ (So as not to + ක්‍රියාව) යන යෙදුම් දෙකට වඩා වෙනස් අර්ථයක් (not to + ක්‍රියාව) යන යෙදුමෙන් ප්‍රකාශ විය හැකි මතක තබා ගන්න.

10. I came not to blame, but to apologise.
(අයි කේම් නොට් ටු බ්ලේම්, බට් ටු ඇපොලොජයිස්)
මම ආවෙ දොස් කියන්න නෙමේ, සමාව ගන්නයි.

11. She told me not to come today but to come tomorrow.
(ෂී ටෝල්ඩ් මී නොට් ටු කම් ටුඩේ, බට් ටු කම් ටුමාරෝ)
ඇය මට කිව්වෙ අද එන්න එපා හෙට එන්න කියලා.

බලන්න ඉහත වැකි වලින් "නොවනු පිණිස" කියන අදහසක් නොකියවෙන බව තේරුම් ගන්න.

# ක්‍රිස්තියානි කලාවේ අගතැන්පත් කලාකරුවෝ
# කතෝලික සංගීතයේ වර්ධනය ⑪



ලූතර් විසින් අරඹන ලද ප්‍රතිරෝමවාදි විප්ලවය නිසා කතෝලික සභාව උග්‍ර මට්ටමක අසහනයකට පත්විය. තම සාමාජික සංඛ්‍යාවෙන් හරි අඩක්ම පමණ එයට අහිමි විය. උද්ගතවී තිබුණ තර්ජනවලට මුහුණ දීමට සභාව අප්‍රමාදව සංශෝධනය කර ප්‍රතිසංවිධානය කළ යුතු බව කතෝලික නා-යකයින්ට පෙනී ගියේය. එහෙත් එය කාර්යක්‍ෂම ලෙස කළ හැකි වූයේ හැම පළාතකම රාජගුරුවරුන්ගේ සහභාගිත්වය ලබන මහා සම්මන්ත්‍රණයක් තුළින් පමණි. ත්‍රිදෙන්තීනු මහා සම්මන්ත්‍රණය සේ හැඳින්වෙන්නට වූ එය 1545 දී අරඹන ලද්දේය.

එම සම්මන්ත්‍රණයෙන් ගනු ලැබූ තීරණ සභාවේ වෙනත් හැම අංශයක සේම කලා අංශයේද සංශෝධනයට හා වර්ධනයට බොහෝ සෙයින් හේතු විය. එම සම්මන්ත්‍රණයෙන් සංගීතඥයන්, චිත්‍රකරුවන්, කැටයම් කරුවන්, ගොඩනැගිලි කරුවන් යන සියලුම කලාශිල්පීන්ගෙන්, සභාවේ දියුණුවට තම ජීවිත ඇපකැප කරන මෙන් විශේෂ ඉල්ලීමක්ද කරනු ලැබුණේය. යුරෝපීය කලාවේ විශිෂ්ඨ නිර්මාණ කිහිපයක් මෙම යුගයේදී බිහිවූයේ එම ඉල්ලීමෙන් කලාකරුවන් තුළ ඇතිවූ උද්‍යෝගය නිසාමයැයි ද කිව හැක.

දේවස්ථාන සංගීතය අවස්ථා කිහිපයකදීම සම්මන්ත්‍රණයේ සාකච්ඡාවලට මාතෘකා විය. මේවන විට එකට ගෙතුනු හඬවල් කිහිපයකින් යුත් මිශ්‍රතාල සංගීත ක්‍රමය තරමක් බහුලව භාවිත වෙමින් තිබුණෙය ගායනා පූජා සඳහා එය නිතර ගනු ලැබුණේය ඇතැම් තාල පිටපත් කර තිබුණෙය. පූජාවකින් තාලයට ගැයුව යුතුවූ කොටස් මේ වන විට තීරණය වීද තිබුණේය. එවැනි කොටස් හයක් විය.

ආරම්භක පද යොදා හැඳින්වුන එම කොටස් නම් (අ) ''කීරියේ'' (ස්වාමිනි කරුණාකළ මැනව) (ආ) ''ග්ලෝරියා'' (උත්කෘෂ්ඨ දෙවියන්ට මහිමය වේවා) (ඊ) ''සාන්ටුස්'' (ශුද්ධවූ , ශුද්ධවූ ශුද්ධවූ) (උ) ''බෙනඩික්ටුස්'' (වඩින තැනැත්තා ආශිර්වාද දිතයි) (ඌ) ''ආඟුඤුස්දේයි '' ( දේව බැටළු පෝතකයාණෝය )''කාල පූජාව ''නමින් හැඳින්වුන සංගීත කෘතිය එම කොටස් හයෙන් යුක්තවිය. ත්‍රිඩෙන්තනු සම්මන්ත්‍රණයට සහභාගී වූ බොහෝ දෙනෙක් මුලින් ''තාල පූජාව '' සඳ හා මිශ්‍ර කාල සංගීත ක්‍රමය යොදා ගනු ලබනවාට විරුද්ධ වූහ.

එහෙත් ඔවුන් එසේ කළේ මාටින් ලූතර් කළාසේ පොදු ජනයාට එයට සහභාගීවීමට නොහැකිවූ නිසාම නොවේ. එයින් පූජාව ඕනෑවට වඩා දිග් ගැස්සුනු නිසා ය. වචන තේරුම් ගැනීමටද එය බාධකයක් වූ නිසාය. ඇතැමුන්ට එය ඕනෑවට වඩා ප්‍රදර්ශනාකාර භේද පෙනුණි. ඔවුන්ට ඕනෑ වුයේ මිශ්‍රතාල සංගීත ක්‍රමය දේවස්ථාන වලින් සම්පූර්ණයෙන්ම පිටමං කරවාගෙන තනිතාල ක්‍රමයක් වූ ග්‍රෙගෝරියානු සංගීතය පමණක් තබාගැනීමට ය.

කෙසේ හෝ අවසානයේදී එම සම්මන්ත්‍රණය මිශ්‍රතාල සංගීතය තහනම් කිරීමෙන් වැළකුනේය. ''අශුද්ධ හා කාම හැඟීම් දනවන'' සංගීතය පමණක් ප්‍රතික්ෂේප කළේය. එහි ප්‍රතිඵලය වූයේ ඊලඟ පනස් වසර මිශ්‍රතාල සංගීතයේ සුවර්ණම යුගය බවට පත්වීම ය. උසස්ම පෙලේ සංගීත ප්‍රබන්ධකරුවන් සමූහයක් යුරෝපයෙ බිහි වන්නට පටන් ගත්තේය. ඒ හැම දෙනෙක්ම කතෝලිකයෝ වූහ. ලූතරානුවාදීහු සමූහික සංගීතයට පමණක් මුල් තැන දුන් නිසා විසිතුරු වූ සංගීතයට රෙපරමාදු සභාවලින් එතරම් අනුබලයක් නොලැබුණේය.

මෙම විශිෂ්ඨ නිර්මාතෘ වරුන්ගෙන් ප්‍රථමයාද ප්‍රධානයාද වනුයේ තම මුළු කාලයම (1525 - 1574) රෝමයේ ගත කළ ඉතාලි ජාතික ගියොවන්ති පියර්ලුවිජි ඩා පලෙස්ට්නා ය ඔහු විසින් සම්පාදනය කරන ලද මාර්සලස් පාප්තුමාගේ තාල පූජාව තීනුසම්මන්ත්‍රණයේද ගායනා කෙරුනු බවත්, සම්මන්ත්‍රණ සභික යෝ මිශ්‍රතාල සංගීතය තහනම් කිරීමෙන් වැලකුනේ එයට ඇහුම්කම් දීමෙන් පසුව බවත් බොහෝ කාලයක් තුළ පැවසුනේය. එහි ඇත්තක් නොමැතිමු ඔහුගේ තාල පූජාව බහුලව භාවිත වූ බවටත් මිශ්‍ර තාල සංගීතය ජනප්‍රිය කිරීමට එය බොහෝ සෙයින් හේතුවූ බවටත් සැකයක් නැත. ඔහුගේ ශෛලියේ පවිත්‍රත්වයෙන් හා ශ්‍රේෂ්ඨත්වයෙන් ඔහු තුළ වූ ගැඹුරු දේව භක්තියද ප්‍රකාශ විය. එය අද පවා රෝමානු කතෝලික පූජාව සඳහා නිපදවනු ලැබූ වඩාත්ම අංගසම්පූර්ණ සංගීත නිර්මාණය සේ සැලකේ.

**සංස්කාරක පියතුමන් විසිනි**

**ඉදිරියට .......**



**ප්‍රසාදි ඉරෝෂිනි පෙරේරා**
09 ශ්‍රේණිය
වික්ෂෝප මාතා දහම් පාසල - ජා-ඇල




පුංචි අපේ චිත්‍ර
පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර,
A4 ( හාෆ්ෂිට් කොලවල ඇඳ )
පාසලේ හෝ දහම් පාසලේ පංති භාර
ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ
නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ
පෞද්ගලික
ලිපිනය හා දුරකතන අංකය ද සහිතව
යොමු කරන්න.

"පුංචි අපේ චිත්‍ර පිටුව"
ළමා ප්‍රදීපය, අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

**ඩිලාන් ඩික්මන් ජයමාන්න**
08 ශ්‍රේණිය
සාන්ත ජූඩ් විදුහල - කුරණ





**දෙව්ඳුනී සෞභාග්‍යා**
06 ශ්‍රේණිය
කටුකුරුන්ද දහම් පාසල
කළමුල්ල මීසම



**විනේත්‍රා රමින්ති**
04 ශ්‍රේණිය
සාන්ත මරියා ප්‍රාථමික
බාලිකා විදුහල - හලාවත

**සදෙව් පියුෂ බෝපෙආරච්චි**
02 ශ්‍රේණිය
සාන්ත ජෝශප් විදුහල
කොළඹ 10



**ඕෂ්නි දිල්රුක්ෂි ජයමාන්න**
06 ශ්‍රේණිය
ශාන්ත නිකුලා දහම් පාසල
බෝපිටිය



# ශු. ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් මුනිතුමා





## සුදුවර චරිතයක් හඳුනාගනිමු

ශු. ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් තුමා වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ පියා වශයෙන් හඳුන්වනු ලබයි. ප්‍රංශයේ රිම්ස් නගරයේ මන්ත්‍රණ සභිකයකුගේ පුත්‍රයෙකි. ඒ නගරයේ ආසන දෙව් මැදුරේ අනුශාසකයෙකු ලෙස ඔහු වයස 16 දී පත් විය. ඔහු වයස අවුරුදු 27 දී පූජක වරය ලැබීය. ඔහු භක්තිවන්ත කමේද , බැහැපත් කමේද ස්වත්‍යාජයේද ආදර්ශයක් විය. ඔහු දිළින්දන් වෙත දැක්වූ මහත් ප්‍රේමය මගින් ඔහුගේ කාර්යය වුයේ දිළිඳු දරුවන්ට අධ්‍යාපනය ලබා දීමය.

මේ කාලයේ මුළු ප්‍රංශය පුරා දේශික හා විදේශික යුද්ධ නිසා පොදු ජනතාවට විනාශය හා කිව නොහැකි දුක් වේදනාවන්ට ගොදුරු වීමට සිදු විය. පාසල් සියල්ලම විනාශ විය. ඒවා අභාවයට ගොස්ය. අඥානකම හා පාපය සැමතැනම රජ කළේය. එවැනි තත්වයක් උදා වෙමින් තිබියදි රිම්ස් නගරයේ නිදහස් අධ්‍යාපන පාසල් දෙකක් ආරම්භ කිරීමට කටයුතු කළේය. ඔහු ගුරුවරුන්ට ඉගැන්වීමේ ක්‍රම ගැන පෞද්ගලිකව උනන්දු විය. ගුරුවරුන් දිරිමත් කෙරිණි. ඔවුනට ඔහුගේ ගෘහය තුළම ආහාර හා ඉඳුම් හිටුම් වාසස්ථාන සැපයිණි.

මෙලෙස ක්‍රිස්තියානි සහෝදරයන්ගේ නිකාය අහම්බෙන් මෙන් ආරම්භ වුණි. එය ස්ථාපනය කළේ 1680 දී ය. එය ස්ථාපනය කලේ චාම් ගතිය, සිත දමනය හා සම්පූර්ණ දේව පරිපාලනයට යටත් වීමෙනි. වසර ගණනාවක් තුළ පීඩන දුක් කරදර මධ්‍යයේ මෙම නිකාය ලොව පුරා පැතිර ගොස් සක්‍රියව පවතී. ඔහුගේ නිකායේ පූජාප්‍රසාදිවරු නොසිටියේය. එහෙත් තම ජීවිතය සම්පූර්ණයෙන්ම අධ්‍යාපනයට හා අපෝස්තලික සේවයට කැප කළ සහෝදරයන් සිටියේය. ශු ජෝන් බැප්ටිස්ට් ද ලාසාල් තුමා අද චින්තකයන් ගේද, අධ්‍යාපනඥයන් ගේද විශිෂ්ට කෙනෙකු ලෙස පිළි ගනී.

ඔහු ක්‍රිස්තියානි ධර්මය ඉගැන්වීමේදී ස්වභාෂාවට ප්‍රධාන තැනක් දුන්නේය. ඒ මන්දයත් දරුවන්ගේ දෙමව් පියන්ටද ධර්මය උගත ගත හැකි වන ලෙසය.

යම් වෘත්තීයකට යොමු වන දරුවන්ට වෘත්තිය අධ්‍යාපනය සඳහා නේවාසික උසස් අධ්‍යාපන ආයතන පිහිටුවිය. පසුව මේ පාසල් පශ්චාත් ප්‍රාථමික පාසල් වලට ආදර්ශයක් විය. තවද ඔහු වැඩිහිටියන් සඳහා පළමු වන ඉරිදා ධර්මය ඉගැන්වීමේ ආයතන පිහිටුවිය. තරුණ ගුරුවරුන්ට නවතම ක්‍රමයන් උගැන්වීම සඳහා ගුරු අභ්‍යාස ආයතන පිහිටුවිය. ඔහුගේ පොත් අතර ඉගැන්වීමේ ක්‍රම, ක්‍රිස්තියානි හැසිරීම ක්‍රිස්තියානි ධර්මෝපදේශය සහ තාපස ජීවිතය සම්බන්ධයෙන් පොත්ද ඇත්තේය.

**අසේල දසනායක**



## ප්‍රහේලිකා අංක 37

**හරහට**

1. යහපත් සමරිතානු වරයාගේ උපමාවේ සොරුනට අසුවූ මිනිසා ගමන් කරමින් සිටියේ මෙම නගරයටය.

4. යහපත් සමරිතානු වරයා සොරුනට අසුවූ මිනිසා ලඟට ගොස් තෙල් සහ මිදියුෂ ගල්වා ........බැඳ තමාගේ මෘගයා පිට හිඳුවා තානායමට ගෙන ගොස් ඔහු බලා ගත්තේය. මෙහි හිස්තැනට සුදුසු වචනය .

5. තමාට විරුද්ධව පව් කරන සහෝදරයාට කමා විය යුත්තේ මෙපමණක් දක්වා පමණදැයි පේදුරුතුමා ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසුවේය.

7. ක්‍රිස්තුන් වහන්සේගේ ගෝලයෝ උපවාස නොකරන්නේ මන්දැයි ක්‍රිස්තුන් වහන්සේගෙන් ඇසූ අවස්ථාවේදී ''.......... තමන් සමග සිටියදී ඔහුගේ ඥාති මිත්‍රාදින්ට ශෝක විය හැකිදැයි'' උන්වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

10. ලාසරස්තුමාගේ එක් සහෝදරියකගේ නම

**පහළට**

1. ක්‍රිස්තුන් වහන්සේ රාජ තේජසින් මෙම නගරයට වඩිනා විට ''සමිඳුන් නමින් වඩිනා රජුට ආසිරි වේවා'' යි කියමින් මිනිසුන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළෝය

2. ස්නාවක ජුවාම් තුමා මිනිසුන්ව බව්තීස්ම ස්නාපනය කළේ මේවායින් බවත්, ක්‍රිස්තුන් වහන්සේ පැමිණි පසු ශුද්ධාත්මයාණන්ගෙන්ද, ගින්නෙන්ද මිනිසුන්ව බෞතීස්ම ස්නාපනය කරන බවත් ජුවාම් තුමා ප්‍රකාශ කළේය.

3. කුරුසිය දරාගෙන මා අනුව නොඑන තැනැත්තාට මාගේ ......... විය නොහැකිය'' යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. හිස්තැනට සුදුසු වචනය

6. අංශබාග රෝගියාව සුවකර ගැනීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ ඉදිරියට පැමිණෙව්වේ මෙට්ටයක තබා නිවසේ මෙය තුළින් පහළට බැස්ස වීමෙනි.

8. ගෝලයන් සැත්තෑ දෙනාගේ ධර්මදූත මෙහෙය අවසානයේදී ක්‍රිස්තුන් වහන්සේ වෙතට හැරී ආ විට ඔබගේ ......... ස්වර්ගයෙහි ලියා ඇති නිසා සංතෝෂ වන්නැයි ක්‍රිස්තුන් වහන්සේ වදාළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

9. ක්‍රිස්තුන් වහන්සේ තම දුක් ප්‍රාප්තියට පෙර ගෝලයන්ට කථා කරමින් ''මම ඔබහට සැබෑව පවසමි. මාගේ නික්ම ...... ඔබගේ ශුභ සිද්ධිය පිණිසය'' යි කී සේක. හිස්තැනට සුදුසු වචනය.

**(මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපයෝගී කර ගත හැකිය. ශු. ලූක් 3,5,10,11,14,19 පරිච්ඡේද , ශු. මතෙව් 9, 18 පරිච්ඡේද ශු. ජුවාම් 16)**

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා** - කිරිමැටියාගාර

---

**← නිවැරදිව ප්‍රහේලිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේලිකා අංක 37, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

## හලාවත පදවි ධර්මදූත ළමා සමාජීය සජීවකයින්ගෙන් වීදි නාට්‍යයක්

තලවිල සාන්ත ආනා ජාතික සිද්ධස්ථානය වෙත වන්දනාවේ පැමිණෙන බැතිමතුන් හට එහි අර්ථය නියමාකාරව පහදාදෙනු සඳහා හලාවත පදවි ධර්මදූත ළමා සමාජයේ සජීවක සජීවිකාවන් විසින් එම තේමාව ඔස්සේ වීදි නාට්‍යයක් රඟ දක්වන ලදී. තලවිල පුදබිමේ පැවති මෙම නාට්‍ය මාලාව පදවි ධර්මදූත අධ්‍යක්ෂ ගරු නිශාන්ත ජානක පියතුමාගේ මග පෙන්වීම යටතේ සංවිධානය කරන ලද අතර අවසානයේදී ඒ සඳහා සහභාගී වූ පිරිස ඡායාරූපයකට පෙනී සිටි අයුරු. **කොකුම් වාසනා ජයරුවන්**




අකීකරු පුත්‍රයා
ජේසු තුමාගේ උපමා කථා ඇසුරෙන්
චිත්‍ර කථා රචනය ආනන්ද කාල්දේරා
චිත්‍ර :- පාලිත - සපුආරච්චි
3
බාල පුතා සිය පියාණන්ගේ නිවෙස වෙතට ළඟාවෙයි. ගේට්ටුව ළඟ සිටින වැරහැලි හැඳගත් මිනිසාව පියාණන් විසින් දකියි... හෙතෙම සේවකයාට කථා කරයි...!
සේවකය... අර ගේට්ටුව අසල සිටින සිගාන්නා-ව මා ළඟට කැඳවාගෙන එන්න....
හොඳමයි ස්වාමිනී..!
අහෝ.. මගේ පුංචි පුතා... පුතා කවදා හරි මා ළඟට එන බව මා දැනගෙන හිටියා...
පියාණෙනි..
පියාණෙනි..! මම නුඹේ පුත්‍රයා යැයි කීමට වත් සුදුස්සෙක් නොවෙමි.. මට සමාවෙන්න..
මගේ නැතිවුන පුත්‍රයා මට නැවතත් හමුවුනා.. මෙහෙකරුවනි... පළමුව මාගේ පුත්‍රයා නාවා.. සුවඳ විලවුන් ගල්වා.. අලුත් ඇඳුම් අන්දවාපල්ලා..
..ඉන් පසුව මංගල භෝජනයක් ලෑස්ති කරපල්ලා... ඒ මක් නිසාද.. මගේ පුත්‍රයා නැසී ගොස්... නැවතත් ජීවිතය ලබා සිටින බැවිනි.....
මගේ නැතිවුන පුතා නැවතත් ලැබුන නිසා මට අද හරිම සතුටුයි... සියලු දෙනාම කාලා බීලා සතුටුවෙයල්ලා..

**ශු. ප්‍රැන්සිස් මුණිඳුන්ගේ**

**කතාව**

# අසීසි නගරයේ දිළින්දා

ඉදිරිපත් කිරීම — ආමල් ද සිල්වා

**20**













